(13)

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2006/03

මගේ අංකය - ප / 5 / දෙපා.ව. / 2006
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.
2006.02.06

සියලුම අධ්‍යක්ෂ වරුන්
ඒකක ප්‍රධානීන්,

**විශිෂ්ඨතම රාජ්‍ය සේවාවක් සඳහා දෛනිකව ලැබෙන ලිපි සම්බන්ධයෙන් තුන්දා නීතිය ක්‍රියාත්මක කිරීම**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දීමට තීරණය කර ඇති බැවින් , ඒ සඳහාවූ සුවිශේෂ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අදහස්කර ඇති බව ජනාධිපති ලේකම්ගේ අංක පීඒ / 1 / 1 / 106 හා 2006.01.19 දිනැති ලිපියෙන් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කර ඇත.

02. සැම රාජ්‍ය ආයතනයකම සේවාවන් උසස් කිරීම සඳහා අඛණ්ඩව පියවර ගැනීම, සේවාවන් මනාලෙස ලබා ගැනීමේ මහජන අයිතිය තහවුරු කිරීම හා මහජන ඉදිරිපත් කිරීම් සඳහා කඩිනම් ඵලදායි ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින ආයතන තුළ ද නව යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මැනවින් සංවිධානය කරන ලෙස ජනාධිපති ලේකම් යථෝක්ත ලිපියෙන් අවධාරණය කරනු ලැබ ඇත.

03. තවද, වතු යටිතල පහසුකම් හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක EILD/S/01 හා 2006.01.24 දිනැති ලිපියේ උපදෙස් අනුව දෛනිකව ලැබෙන ලිපි සම්බන්ධයෙන් එදිනම හෝ උපරිම වශයෙන් දින තුනක් ඇතුලත පිළිතුරු යැවිය යුතුය. එසේ නොමැතිනම් හා අවසන් විසඳුමක් දීම ප්‍රමාද වන්නේ නම් අවම වශයෙන් එම දින තුන තුළ අතුරු පිළිතුරක් හෝ යැවිය යුතුය. ලිපියේ වැදගත් කම හා හදිසි ස්වභාවය අනුව එදිනම කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

04. එබැවින් , මින් ඉදිරියේ දී ලිපි ගණු දෙනු කිරීමේදී ඉහත දක්වා ඇති උපදෙස් පරිදි කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔබ ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට හා ඒ අනුව නොපමාව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

එස්.කේ.ආර්. අමරසේකර.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.